## කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (විශේෂ) - සිව්වන වසර

## සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය-2016/2017

## DMG 4263: ව්‍යාපාර ප්‍රජාවිද්‍යාව

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.** **කාලය පැය දෙකයි (02)**

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.**

**ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.**

---

1. අ ) "ව්‍යාපාර ප්‍රජාවිද්‍යාව"නිර්වචනය කර, ව්‍යාපාර විශ්ලේෂණ සඳහා එහි ඇති යෝග්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ) පහත සඳහන් ප්‍රකාශ වලින් දැක්වෙනුයේ 2015 සහ 2016 අතර කාලය තුලදී එක්සත් රාජධානියේ ව්‍යාපාර පිලිබඳ සිදුවූ විශ්ලේෂණයකි. මෙම තොරතුරු පදනම්කරගෙන එක්සත්රාජධානියේ ව්‍යාපාර පිලිබඳ ගතහැකි තීරණ ව්‍යාපාර විශ්ලේෂකයෙකුගේ දෘෂ්ටි කෝණයෙන් සඳහන් කරන්න.

- වර්ෂ 2015 සහ 2016 අතර කාලය තුලදී එක්සත්රාජධානියේ ව්‍යාපාරික උපත්ප්‍රමාණය 383,000 සිට 414,000 දක්වා නොකඩවා වැඩිවී ඇති අතර 2015 දී 14.3%ක් වූ උපත් අනුපාතිකය 2016 දී 14.6% දක්වා වැඩිවී ඇත.
- 2015 සහ 2016 වර්ෂවලදී එක්සත්රාජධානියේ ව්‍යාපාරික මරණ ප්‍රමාණය නොකඩවා 283,000 සිට 328,000 දක්වා වැඩිවී ඇති අතර 2015 දී 10.5%ක් වූ මරණ අනුපාතිකයක 2016 දී 11.6% දක්වා වැඩිවී ඇත.
- ලන්ඩන් නගරයෙන් 17.5%ක් වූ ඉහළම උපත් අනුපාතිකයක් සහ 14%ක් වූ ඉහළම මරණ අනුපාතිකයක් 2016 වසරේදී වාර්තාවී ඇත.
- 2016 වර්ෂයේදී එක්සත් රාජධානියේ පුළුල් කර්මාන්ත වර්ගීකරණයට අනුව, ව්‍යාපාර පරිපාලන සහ සහය සේවාවන්හි 23.1% ඉහළම උපත් අනුපාතිකයක් සහ මූල්‍ය සහ රක්ෂණ ආයතනයන්හි 17%ක ඉහළ මරණ අනුපාතිකයක් වාර්තා වී ඇත.

මූලාශ්‍රය: සංඛ්‍යාන නිබන්ධනය, 2016

(ලකුණු 06)

ඇ) ව්‍යාපාර ප්‍රජාවිද්‍යාව විෂයක් ලෙස පරිණාමය වීම සඳහා පාදක වූ කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

2. ඇමරිකා එක්සත් ජනපදයේ 2016 සහ 2017 යන වර්ෂවල තිබූ විවිධ වර්ගයේ ක්‍රියාකාරී ව්‍යාපාර ආයතනවල උපත් සහ මරණ පහත වගුවෙන් දැක්වේ. මෙම දත්ත පදනම් කරගෙන අවශ්‍ය මිනුම් ගණනය කොට, ව්‍යාපාර ආයතන පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් කරන්න.

| ව්‍යාපාර ආයතන වර්ගය | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | ක්‍රියාකාරී ව්‍යාපාර ආයතන | උපත් | මරණ | ක්‍රියාකාරී ව්‍යාපාර ආයතන | උපත් | මරණ |
| නිෂ්පාදන | 165 | 21 | 14 | 170 | 18 | 19 |
| ඉදිකිරීම් | 336 | 50 | 32 | 359 | 52 | 41 |
| මෝටර්රථ වෙළඳාම | 80 | 8 | 7 | 84 | 10 | 8 |
| තොග වෙළඳාම | 118 | 11 | 11 | 117 | 11 | 13 |
| සිල්ලර වෙළඳාම | 217 | 24 | 23 | 222 | 28 | 24 |
| ගමනාගමන සහ ගබඩා කිරීම් | 102 | 22 | 11 | 120 | 28 | 14 |
| නවාතැන් සහ ආහාර පාන සේවා | 172 | 25 | 22 | 177 | 27 | 25 |
| තොරතුරු සහ සන්නිවේදන | 231 | 38 | 22 | 244 | 35 | 28 |
| මූල්‍ය සහ රක්ෂණ | 44 | 7 | 7 | 46 | 7 | 9 |
| දේපළ | 108 | 14 | 9 | 112 | 14 | 18 |
| වෘත්තීය, විද්‍යා සහකාර්මික | 513 | 82 | 51 | 549 | 87 | 63 |
| ව්‍යාපාර පරිපාලන සහ සහයක සේවා | 252 | 52 | 28 | 279 | 65 | 44 |
| අධ්‍යාපන | 42 | 6 | 4 | 49 | 10 | 5 |
| සෞඛ්‍යය | 121 | 16 | 9 | 132 | 18 | 13 |
| ශාස්ත්‍රීය , විනෝද, ක්‍රීඩා සහ අනෙකුත්සේවාවන් | 186 | 20 | 1 | 189 | 18 | 19 |

(ලකුණු 20)

3. අ) ව්‍යාපාරයකට විභවතාවක් සහිත ගැණුම්කරුවන් තෝරාගැනීම සඳහා ප්‍රජාවිද්‍යාත්මක දැනුම භාවිතා කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) ව්‍යාපාර පරිසරය හා සම්බන්ධ සාධක ව්‍යාපාරයේ සාර්ථකත්වයට උපයෝගී කරගත හැකි ආකාරය පිළිබඳව විමසීමක් කරන්න.

(ලකුණු 10)

4. Jeoffery A. Moore විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපාර ජීවන චක්‍රයේ විවිධ අවස්ථාවන් පැහැදිලි කර එම රාමුව ව්‍යාපාරයක තීරණ ගැනීම සඳහා යොදාගත හැකි ආකාරය උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 20)

5. අ) ව්‍යාපාරයන්හි ප්‍රජාවිද්‍යාත්මක විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය දත්ත මුලාශ්‍ර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) "A"නැමැති රටෙහි 2012 වසරේ කාර්මික පුද්ගලික ව්‍යාපාර මියයෑමේ සම්භාවිතාවට (බිඳවැටීමට) අදාල දත්ත පහත සඳහන් වගුවෙන් ඉදිරිපත් කර ඇත. එම ජීවන වගුව සම්පූර්ණ කර, "A" නැමැති රටෙහි කාර්මික පුද්ගලික ව්‍යාපාර පිළිබඳව තීරණ ගැනීම සඳහා එම දත්ත උපයෝගි කරගත හැකි ආකාරය විමසන්න.

A නැමැති රටෙහි කාර්මික පුද්ගලික ව්‍යාපාර සඳහා ජීවන වගුව, 2012

| වයස | $_nq_x$ | $l_x$ | $_nd_x$ | $_nL_x$ | $T_x$ | $e_x$ |
|---|---|---|---|---|---|---|
| 0-1 | 0.1768 | 100,000 | | | | |
| 1-2 | 0.1862 | | | | | |
| 2-3 | 0.1636 | | | | | |
| 3-4 | 0.1325 | | | | | |
| 4-5 | 0.1211 | | | | | |
| 5-6 | 0.1080 | | | | | |
| 6-7 | 0.0880 | | | | | |
| 7-8 | 0.0815 | | | | | |
| 8-9 | 0.0784 | | | | | |
| 9-10 | 0.0671 | | | | | |
| 10 සහ ඊට වැඩි | 1 | | | 27,525 | | |

(ලකුණු 12)